| ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙහි ලකුණු දීමේ පටිපාටිය | | මුළු ලකුණු |
|---|---|---|
| 02. | භාෂා ප්‍රවීණතාවය - (අතිරේක සුදුසුකම්) අ.පො.ස. (සා/පෙළ) භාෂාව විෂයට සිංහල/දෙමළ/ ඉංග්‍රීසි යන භාෂා සඳහා අධි සාමාර්ථ ලබා තිබීම. (එක් විෂයකට ලකුණු 03 බැගින්) | 09 |
| | අ.පො.ස. (උ.පෙළ) විභාගයේ සිංහල/දෙමළ/ ඉංග්‍රීසි යන භාෂා සඳහා සාමාර්ථයක් හෝ ඉහත විෂයන් පිළිබඳව රජය පිළිගත් ආයතනයක පාඨමාලාවක් හදාරා විෂය පිළිබඳව ලබාගත් ඩිප්ලෝමා හෝ එවැනි සහතිකයක්. (මාස 06 කට වැඩි පාඨමාලාවක්) එක් භාෂාවකට ලකුණු 05 බැගින් | 15 |
| 03. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් - | |
| | (i) නීති ක්ෂේත්‍රයේ උපාධිය | 10 |
| | (ii) නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය | 15 |
| | (iii) අනිකුත් ක්ෂේත්‍ර පිළිබඳ උපාධිය (භාෂා ක්ෂේත්‍රයේ නොවන) | 5 |
| 04. | පෞරුෂත්වය | 8 |
| 05. | පළපුරුද්ද නීතිඥ වෘත්තියේ වසර 02 ට වඩා පළපුරුද්ද (වර්ෂයකට ලකුණු 02 බැගින් වර්ෂ 04) | 8 |
| | එකතුව | 100 |

(i) සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් පමණි.

(ii) සම්මුඛ පරීක්ෂණය සිංහල සහ ඉංග්‍රීසි/දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයින් භාෂා දෙකෙන්ම ප්‍රශ්න වටහාගෙන පිළිතුරු ලබා දීමේ හැකියාවෙන් යුක්ත විය යුතුය.

(iii) සමත් කිරීම සඳහා ලකුණු 40 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගත යුතු ය. සමත් වූ අපේක්ෂකයින් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

(සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සහතික පත්‍රවල මුල් පිටපත් හෝ නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

(ආ) *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*
මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

(ඇ) *සේවා කොන්දේසි :*

පත්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වූ ඡේදවලට යටත්වනු ඇත.

බඳවා ගැනීම, සේවයේ යෙදවීම, විනය හා අනෙකුත් ආයතනික කටයුතු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසි සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන විධිවිධාන අදාල වේ.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත තනතුරට නියමිත දෙවැනි බස සඳහා භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

05. (අ) අයදුම්පත් 2009.10.23 දින හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12.

(ආ) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ (23cm x 25cm ප්‍රමාණයේ) කඩදාසියක සකස් කර ඉල්ලුම්කරු විසින් ම තමන්ගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. (එහි මුල් පිටුවේ අංක 01 සිට 08 දක්වා වූ ඡේදවලට අදාළ විස්තරද, දෙවන පිටුවේ අංක 9 සිට 11 දක්වා වූ ඡේදවලට අදාළ විස්තර ද, තුන් වන පිටුවේ අංක 12(i) සිට 12(ii) දක්වා වූ ඡේද වලට අදාල විස්තර ද සඳහන් විය යුතු ය.)

(ඇ) අයදුම්පත්‍රය බහාලන කවරයේ වම් කෙළවරේ "නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(ඈ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමාදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු හෝ රු. 20,030 කට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඉ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

06. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. i. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරන...... මහතා/මහත්මිය/මෙනෙවිය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය 2009 ... මස... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් මෙයින් සහතික කරමි.

———.
සහතික කරන්නාගේ අත්සන

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :———.

තනතුර :———.

ලිපිනය :———.

දිනය :———.

12. ii. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

අයදුම්කරු/අයදුම්කාරිය ඉහතින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, නිවැරදි බවත් ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

———.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන.

පදවි නාමය :———.

දිනය :———.

10-98

---

## ශ්‍රී ලංකා රැකියා බැංකුව මගින් රැකියා ලබා දීමේ ජාතික ව්‍යාපෘතිය (www. Srilankajobs.net)

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නියෝජිත ආයතනය (ICTA), ඊ- ශ්‍රී ලංකා සංවර්ධන වැඩ සටහන දියත් කිරීම සඳහා වගකීම් දරන රාජ්‍ය ආයතනය වන අතර එය ජාතිය වෙනුවෙන් තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ ප්‍රතිපත්ති මෙහෙයවීමේ හා සංවර්ධනය කිරීමේ නියුතු එකම ආයතනයද වේ. මේ ආයතනය යටතේ ක්‍රියාත්මක වන වැඩ සටහන් අතර ප්‍රධාන තැනක් උසුලන ඊ - සමාජ සංවර්ධන වැඩ සටහනෙහි අරමුණ වන්නේ සමාජයේ වරප්‍රසාද නොලත් සෑම ජන කොටසකටම තොරතුරු සන්නිවේදන තාක්‍ෂණයේ ප්‍රතිලාභ ළඟා කරදීමයි.

ශ්‍රී ලංකා රැකියා බැංකුව, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නියෝජිත ආයතනයේ (ICTA) ප්‍රජා සහන ව්‍යාපෘතියේ ඊ - සමාජ සංවර්ධන වැඩ සටහන අරමුදල් යටතේ ක්‍රියාත්මක වේ. මෙය අන්තර්ජාල වෙබ් අඩවියක් ලෙස ක්‍රියාත්මක වන අතර රාජ්‍ය අංශයේ රැකියා, පුද්ගලික අංශයේ රැකියා, රාජ්‍ය අංශයේ සුහද මාරුවීම්, දේශීය සහ විදේශීය රැකියා අවස්ථා සඳහා අපේක්‍ෂකයින් යොමු කිරීම මෙම වැඩසටහනෙහි මූලික අරමුණයි.

රැකියා අපේක්ෂිකයින්ගේ දත්ත අන්තර්ජාල ගත කොට සෘජුවම එම ආයතනය සමග සම්බන්ධ වීමෙන් රැකියා අවස්ථාවන් වලට යොමු කිරීම කඩිනම් කෙරේ. අපේක්‍ෂකයින්ගේ ජීව දත්ත අන්තර්ජාලයට ඇතුළත් කිරීමෙන් සහ සෘජුවම ආයතන සඳහා රැකියා අපේක්ෂිකයින්ගේ සුදුසුකම් මත ඔවුන් යොමු කිරීම මගින් කෙටි කාලීන රැකියා ලබා දීමේ ව්‍යාපෘතියකි.

**ඔබට අයදුම් කළහැකි රැකියා අවස්ථාවන්**

පෙර පාසල් ගුරු තනතුර
පෙර පාසල් සහායිකා තනතුර
තැපැල් සේවා නිලධාරී
සිංහල ටයිප් සෙටින් ක්‍රියාකරුවන්
බිල් ලියන්නන්

පිළිගැනීමේ නිලධාරී
වයරින් බාස්වරුන්
ලිපිකාරිණියන්
පරිගණක දැනුම ඇති ලිපිකාරිණියන්
කොත්තු බාස්වරුන්
ෆාමසි ලිපිකරුවන්
හෙදියන්
වාහන විදුලි කාර්මිකයින්
පොටෝ කොපි යන්ත්‍ර අලුත් වැඩියා කරන්නන්
ටී මේකර්වරුන්
ෆාමසි බෙහෙත් නිකුත් කරන්නන්
පිරිසිදු කරන්නන්
ගෙවතු අලංකාර කරන්නන්
චැනල් සහයකයින්/සහායිකාවන්
ෆාමසි සහායක
වීදුරු යන්ත්‍ර ක්‍රියාකරුවන්
පැස්සුම් කරුවන්
තහඩු වැඩ කාර්මිකයන්
ට්‍රැක්ටර් රියදුරන්
විශ්‍රාම ගිය රියදුරන්
කාර් රියදුරන්

වැඩ පරීක්ෂකවරුන්
වාහන පිරිසිදු කරන්නන්
වීදුරු කපන්නන්

වාහන මෝටර් විදුලි කාර්මික වරුන්
ටී. වී. රේඩියෝ, කැසට්, යන්ත්‍ර අලුත් වැඩියාකරුවන්
විදුලි ඉංජිනේරු කාර්මික ශිල්පීන්
ලැමිනේටර් යන්ත්‍ර ක්‍රියාකරුවන්
ස්ලිටර් යන්ත්‍ර ක්‍රියාකරුවන්
මෝටර් වාහන අලුත් වැඩියා අත්උදව්කරුවන්
සම්පල්රූම් ඇඳුම් මසන්නන්
කාර්යාල කාර්ය සහායක තනතුර
කම්කරු තනතුර
අලෙවි නිලධාරීන්
පරිගණක ක්‍රියාකරුවන්
ග්‍රැෆික් ඩිසයිනර්වරු
ආරක්‍ෂක නිලධාරීන්
රූපලාවන්‍ය ශිල්පීන්
මේසන් බාස්වරුන්
වේටර්වරුන්
හෝටල් පිරිසිදු කරන්නන්
බේකරි පිරිසිදු කරන්නන්
පුද්ගලික ලේකම්වරියන්
කෝකිවරුන්
චයිනීස් කෝකිවරු
රූම්බෝයි (පුහුණු/නුපුහුණු)
බේකරි බාස්වරුන්
ගෘහ සේවිකා
සාත්තු සේවිකා

මෝටර් සයිකල් මිකැනික්වරු
ඇලුමිනියම් වෑද්දුම්කරුවන්
ඉන්ජෙක්ටර් පොම්ප අළුත්වැඩියා කරුවන්
ඉංග්‍රීසි මාධ්‍ය පෙරපාසල් ගුරුවරු
ස්කැවේටර් රියදුරන්
අකුණු සන්නායක සවිකිරීම කාර්මික ශිල්පීන්
ගෘහ භාණ්ඩ පින්තාරුකරුවන්
M. D. F. භාණ්ඩ නිෂ්පාදන කරුවන්
ග්‍රිල් ගේට්ටු නිෂ්පාදකයින්
ලොරි රියදුරන්
බැකෝ යන්ත්‍ර ක්‍රියාකරුවන්
ජෙනරේටර් කාර්මිකවරුන්

ස්පීන්ප්‍රින්ටින් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු
ඔප්සෙට් යන්ත්‍ර ක්‍රියාකරුවන්
කෝඩ් මැෂින් ක්‍රියාකරුවන්
කෝඩ් මැෂින් ක්‍රියාකරුවන්
විදුලි සංදේශ ඉදිකිරීම කාර්මික
එම්බ්‍රොයිඩර් ක්‍රියාකරුවන්
වායුසමීකරණ අළුත්වැඩියාකරුවන්
ෆැලැක්ලොට් මැෂින් ක්‍රියාකරුවන්
මෝටර් A/C අළුත් වැඩියාකරුවන්
පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු තනතුර
බැංකු ලිපිකරු තනතුර
දුරකථන ක්‍රියාකරු තනතුර
ඉංග්‍රීසි ටයිප් සෙටින් ක්‍රියාකරුවන්
වෙබ් අඩවි නිර්මාණ කරුවන්
කාර්යාල සහායක
වඩුබාස්වරුන්
වෙළඳ සේවක
පොලිෂ් බාස්වරුන්
ජලනල කාර්මිකයන්
ගෙවතු පිරිසිදු කරන්නන්
දිවා සුරැකුම් මධ්‍යස්ථාන සේවිකා
වෛද්‍ය මධ්‍යස්ථානවල බෙහෙත් නිකුත් කරන්නන්
හෙද සහායකයින්
ආයුර්වේද වෛද්‍යවරුන්
එක්ස්රේ ශිල්පීන්
ත්‍රිවිල් අළුත්වැඩියාකරුවන්
දන්ත සහායක
වෛද්‍ය රසායනාගාර සේවක

විදුලි කේබල් නිපදවන යන්ත්‍ර ක්‍රියාකරුවන්
වෙල්ඩින් කරුවන් MIG/TIG
ලියවන පට්ටල් කරුවන්
බෘම් ට්‍රක් රියදුරන්
කන්ටේනර් රියදුරු
ටයර් බාස්වරුන්
විදුලි උපකරණ අළුත් වැඩියාකරුවන්
බරවාහන රියදුරන්
ජේසීබී රියදුරන්
ටාටා ලේලන්ඩ් බස් රථ රියදුරුන්
ඇගළුම් තත්ව පාලකවරුන්
මාකර් කටර් මිකැනික්වරුන්
සුපවයිසර්වරුන්
අයන් ඔපරේටර් වරුන්
ඇඟලුම් අත්උදව් කරුවන්
යකඩ වෑද්දුම් කරුවන්
ජුකී මැෂින් ක්‍රියාකරුවන්
වතුර පොම්ප අළුත්වැඩියාකරුවන්
ජුකී මැෂින් අළුත්වැඩියාකරුවන්

ඔබට අයදුම් කළහැකි රැකියා අවස්ථාවන් (Posts you can Apply for)

Admin/Support
Construction/Civil/Engineering
It/Software/Graphic
Sports/Recreation/Fitness
Beauty/Cosmatics
Hotels/Restaurants/Food
Store Keepers
Airline/Marine
Human Resources
Teaching/Academic/Library
Accountant
Eng/Mech/Auto/Elec
Other Opportunities
Media/Advert/Communication
Corporate Management
Legal/Law
Web Design
Customer Relations
Med/Healthcare/Nursing
Banking/Finance
Hospitality/Tourism
Textile and Apparel
Agriculture/Dairy
Fashion/Design
Production Supervision
Sales/Marketing/Merchandising
Foreign Employment
R & D/Lab/Technologist

ඉහත දැක්වෙන රැකියා අවස්ථාවන්ට යොමු කිරීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව සකසන ලද අයදුම් පත්‍රය 2009.12.31 දිනට පෙර පහත ලිපිනයට යොමු කරන්න. ඊ - ශ්‍රී ලංකා ප්‍රජා සහන ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා රැකියා බැංකුව, අංක 14, සෙවනගල.

01. මුලකුරු සමග නම
02. මුලකුරු වලින් හැඳින්වෙන නම්
03. ස්ථිර ලිපිනය
04. පරිපාලන දිස්ත්‍රික්කය
05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
06. ග්‍රාම නිලධාරි වසම
07. උපන් දිනය
08. වයස : අවුරුදු මාස. දින
09. ජා. හැ. ප. අංකය
10. ස්ත්‍රී/පුරුෂ භාවය
11. විවාහක/අවිවාහක බව
12. උස
13. බර
14. විද්‍යුත් තැපෑල
15. ස්ථාවර දුරකථන අංකය/පුද්ගලික දුරකතන අංකය
16. ඔබ සොයන්නේ දේශීය රැකියාවක් ද, විදේශීය රැකියාවක් ද යන වග
17. අපේක්ෂිත රැකියා අවස්ථා 04 ක් සඳහන් කරන්න
18. අධ්‍යාපන සුදුසුකම්
19. භාෂා නිපුණතාවය
20. වෘත්තීය සුදුසුකම්
21. වෘත්තීය පළපුරුද්ද

10-168

